පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

# දෙවන වාර පරීක්ෂණය - 2019

## නර්තනය-I, II

පාසලේ නම : ......................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................

..................................................

කාලය : පැය 2 යි.

## I – පත්‍රය

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ❖ **1 සිට 5 දක්වා ප්‍රශ්න වල අදාල පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. උඩරට පා සරඹ සබරගමුවේදී හඳුන්වනු ලබන්නේ,
   i. ගොඩ සරඹ ලෙසය  ii. මණ්ඩිපද ලෙසය
   iii. ඉලංගම් සරඹ ලෙසය  iv. දොඹින පද ලෙසය

02. ජීවන වෘත්තින් හා බැඳි ගැමි නැටුමක් වන්නේ,
   i. තාලම් නැටුම  ii. පතුරු නැටුම
   iii. ගොයම් නැටුම  iv. රබන් නැටුම

03. විකල්ප වාදන උපකරණයක් නොවන්නේ,
   i. ථිං බෙරය  ii. ගස්ලබු බට නළාව
   iii. එක්ස්රේ බෙරය  iv. ගැටබෙරය

04. වන්නම් මුල් කාලයේදී රචනා වී ඇත්තේ
   i. නර්තනය සඳහාය  ii. ගායනය සඳහාය
   iii. වාදනය සඳහාය  iv. නාට්‍ය සඳහාය

05. මාත්‍රා 2+3 දෙතිතට නටනු ලබන වන්නම වන්නේ
   i. හනුමා වන්නම  ii. සිංහරාජ වන්නම
   iii. වෛරොඩි වන්නම  iv. තුරඟා වන්නම

- 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තොරා ලියන්න.

06. "ලෙල දෙමිනේ මල උඩුගුවනේ" මෙම කවි පදය අයත් වන්නේ................................................ ය.

07. උඩරට සම්ප්‍රදායේදී හඳුන්වනු ලබන හිසවෙස් බැඳීමේ මංගල්‍යය පහතරට සම්ප්‍රදායේ දී ......................................................... ලෙස හඳුන්වයි.

08. සබරගමු සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය ......................................................... යි.

09. ......................................................... අතින් හා කඩිප්පුවෙන් වාදනය කරනු ලබන දේශීය වාද්‍ය භාණ්ඩයකි.

10. තුරඟා වන්නම මගින් කියවෙන්නේ, .........................................................

( තලමල වරුණ කවි, දවුල, ගොයම් කවි , පහන් මඩු ශාන්ති කර්මය, සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය, කඩවර කංකාරිය, තම්මැට්ටම, මඩු බැසීමේ මංගල්‍යය, සිදුහත් කුමරුන්ගෙ උයන් කෙළිය)

Education NCP - www.edncp.lk

- 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර ඉදිරියේ හරි නම් (√) ලකුණද වැරදිනම් (X) ලකුණද යොදන්න.

11. දෙවොල් මඩුව උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කරමයයි. ( )

12. "රංතෙලඹු වර්ණනාවේ කවි" කුළු නැටුම් සඳහා යොදා ගනු ලබයි. ( )

13. "දොං ජිංත ගතදොංත " මාත්‍රා 3+3 තනි තිතට අයත් බෙර පදයකි. ( )

14. පහතරට බෙරය සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයකි. ( )

15. "තත් තොග තක තොග " වෛරෝඩි වන්නමට අයත් අඩව්වකි. ( )

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යා කරන්න.

| | |
|---|---|
| 16. රාමසාන් උත්සවය | තාලම් නැටුම |
| 17. තජ්ජිත් තකජිත් තජ්ජිත් තොංනංතා | පතුරු නැටුම |
| 18. උඩරට නර්තන සම්ප්‍රදාය | කස්තිරමකි |
| 19. වෘත්තිය හා බැඳි ගැමිනැටුමක් නොවන්නේ | අල්ලාහ් දෙවියන් |
| 20. තාලම්පට අතටගෙන රඟනු ලබන්නේ | වෙස් ඇඳුම් කට්ටලය |

(ල. 2x 20=40)

Education NCP - www.edncp.lk

## නර්තනය - II පත්‍රය

**ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01.
- i. දෙතිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 03)
- ii. "දොං ජිංත ගත දොංත " බෙර පදය ප්‍රස්ථාර කරන්න. (ලකුණු 03)
- iii. ඔබ දන්නා කුළු කවියක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

02.
- i. ගැමි නැටුම් යන්න හඳුන්වන්න. (ලකුණු 03)
- ii. ඔබ දන්නා ගැමි නැටුම් 03ක් නම් කරන්න. (ලකුණු 03)
- iii. කුළු කවියක් හා තාලම් කවියක් ලියා දක්වන්න. (ලකුණු 06)

03.
- i. ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් 03 ට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ලකුණු 03)
- ii. දවුල වාදනය කරන අවස්ථා 03 ක් නම් කරන්න. (ලකුණු 03)
- iii. දවුලෙහි රූපසටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ලකුණු 06)

04.
- i. සැරසිලි අංගයක් නිර්මාණය කිරිමට යොදා ගන්නා අමු ද්‍රව්‍ය 03 ක් නම් කරන්න. (ලකුණු 03)
- ii. ගොප් කොළ සැරසිල්ලක් ඇඳ දක්වන්න. (ලකුණු 03)
- iii එම සැරසිල්ල සකසා ගන්නා ආකාරය ලියා දක්වන්න. (ලකුණු 06)

05.
- i. දේශිය නර්තන සම්ප්‍රදායන් තුනෙහි ශිල්පීය ප්‍රාගුණ්‍යය දක්වන අවස්ථා 03 ක් ලියන්න. (ලකුණු 03)
- ii. උඩරට නර්තන සම්ප්‍රදායේ කළඑලි මංගල්‍යය හා බැඳි චාරිත්‍ර 03 නම් කරන්න. (ලකුණු 03)
- iii. විකල්ප වාද්‍ය භාණ්ඩ 03ක් සහ සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 03ක් නම් කරන්න. (ලකුණු 06)

06.
- i. පෙරහැරක දක්නට ලැබෙන නර්තනාංග 03 ක් නම් කරන්න. (ලකුණු 03)
- ii. ශ්‍රී ලාංකික සංස්කෘතිය හා බැඳි උත්සව 03 ක් නම් කරන්න. (ලකුණු 03)
- iii. රාමසාන් උත්සවය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

07.
- i. නම්‍යතා අභ්‍යාස වල යෙදීමෙන් ලබා ගත හැකි ප්‍රයොජන 03 ක් ලියන්න. (ලකුණු 03)
- ii. වැසි දිනයකදී පරිසරයේ සිදුවන වෙනස්කම් 3ක් ලියන්න. (ලකුණු 03)
- iii. "උත්සාහය" නැමැති ස්ථායි භාවය නිරූපණය කළ හැකි සිද්ධියක් ලියා දක්වන්න. (ලකුණු 06)

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440